# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2385/15 – 2024 මැයි මස 22 වැනි බදාදා – 2024.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලෛවීමන්කාමම් උතුර (J/236) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පලෙ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ya/TLL/2018/38 හා 2018.05.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** - කලන්තලෛසිඩ්ඩි - ප්‍රමාණය: හෙක්. 0.0282

උතුරට: ලෝගාම්පිකෙ කාන්කේයන් සහ සින්නයියා සාම්පසිවමූර්ති හිමිකම් කියන කලන්තලෛසිඩ්ඩි; නැගෙනහිරට: සින්නයියා සාම්පසිවමූර්ති හිමිකම් කියන කලන්තලෛසිඩ්ඩි සහ පාර; දකුණට: පාර සහ මාර්ග (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ලෝගාම්පිකෙ කාන්කේයන් හිමිකම් කියන කලන්තලෛසිඩ්ඩි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/5/2018/HA/03.
2024 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0157